# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති ශ්‍රී ලංකාවේ "අංක 1" රාජ්‍ය වාණිජ බැංකුව වන ලංකා බැංකුව, තාක්‍ෂණ අංශයෙහි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පද්ධති විශ්ලේෂක / පරිගණක ක්‍රම සම්පාදක

### යෝග්‍යතා නිර්ණායක

### 01. සුදුසුකම් හා පළපුරුද්ද

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්‍ෂණය පිළිබඳව පළමුවන හෝ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත උපාධියක් තිබීම.

හෝ

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් සමග මෘදුකාංග සංවර්ධනය / තත්ත්ව සහතික කිරීම / දත්ත සමුදාය පරිපාලනය / තොරතුරු ආරක්‍ෂණය පිළිබඳව අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් තිබීම.

### 02. වෙනත් සුදුසුකම්

- තොරතුරු පද්ධති ආරක්‍ෂණය / දත්ත සමුදාය පරිපාලනය සහ මෘදුකාංග තත්ත්ව සහතික කිරීම පිළිබඳව වෘත්තීයමය සුදුසුකම් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- මෘදුකාංග තත්ත්ව සහතික කිරීම / දත්ත සමුදාය පරිපාලනය / තොරතුරු ආරක්ෂණය හෝ Enterprise / Advanced JAVA, J2EE, XML, RPG, ILE, CLLE, Dojo, Spring MVC, Web Sphere, C#, .Net, HTML උපයෝගීකර ගනිමින් මෘදුකාංග සංවර්ධනය කිරීම පිළිබඳ පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- ස්වයං අභිප්‍රේරිතබව සහ ප්‍රතිඵල කරා දිශානුගත බව
- ගැටලු විසඳීමේ විශිෂ්ට කුසලතා සමග ඉහළ තව්‍යකරණ හැකියාවක් තිබීම.

### 03. වයස

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 හෝ ඊට අඩු විය යුතුය.

### 04. නියමයන් හා කොන්දේසි

- මෙම තනතුර බැංකු සේවයේ පොදු නියමයන් හා කොන්දේසිවලට යටත් වන අතර, සාමාන්‍ය බැංකු ධාරාවෙන් පරිබාහිර වේ. (සංවෘත සේවය)
- අයදුම්කරු සුදුසු යැයි හැඟී ගියහොත් වසර දෙකක (02) පරිවාස කාල සීමාවකට පසුව බැංකු සේවයේ ස්ථිර කාර්යමණ්ඩලයේ පද්ධති විශ්ලේෂක / පරිගණක ක්‍රම සම්පාදක - 1 තනතුරෙහි තහවුරු කරනු ලැබේ.
- මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය

  *රු. 49,195/- රු. 65,995/-*

  *රු. 840/- x 20*

  (විචල්‍ය ජීවන වියදම් දීමනාව ඇතුළු සියලු දීමනා සහිත ආරම්භක දළ වැටුප මසකට රු. 102,400/ - ක් පමණ වේ)
- කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත / නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

## ජාල / සන්නිවේදන ඉංජිනේරු

### යෝග්‍යතා නිර්ණායක

### 01. සුදුසුකම් හා පළපුරුද්ද

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලබාගත් විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් සමග ජාල සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබීම

හෝ

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින්, විදුලි සංදේශනය විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් සහ CCNA සහතිකය සමග ජාල සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබීම

හෝ

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක පද්ධති හා ජාලයන් පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියක් සමග ජාල සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබීම

හෝ

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය සහ CCNA සහතිකය සමග ජාල සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයෙහි වසර 2 ක පළපුරුද්දක් තිබීම

### 02. වෙනත් සුදුසුකම්

- ස්වයං අභිප්‍රේරිතබව සහ ප්‍රතිඵල කරා දිශානුගත බව
- අවශ්‍යතාව මත දිවයින පුරා පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් විසින්ත කිරීමේ හැකියාව.

### 03. වයස

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 ක් හෝ ඊට අඩු විය යුතුය.

### 04. නියමයන් හා කොන්දේසි

- මෙම තනතුර බැංකු සේවයේ පොදු නියමයන් හා කොන්දේසිවලට යටත් වන අතර, සාමාන්‍ය බැංකු ධාරාවෙන් පරිබාහිර වේ. (සංවෘත සේවය)
- අයදුම්කරු සුදුසු යැයි හැඟී ගියහොත් වසර දෙකක (02) පරිවාස කාල සීමාවකට පසුව බැංකු සේවයේ ස්ථිර කාර්යමණ්ඩලයේ ජාල / සන්නිවේදන ඉංජිනේරු - 1 තනතුරෙහි තහවුරු කරනු ලැබේ.
- මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය

  රු. 49,195/- රු. 65,995/-

  රු. 840/- x 20

  (විචල්‍ය ජීවන වියදම් දීමනාව ඇතුළු සියලු දීමනා සහිත ආරම්භක දළ වැටුප මසකට රු. 102,400/ - ක් පමණ වේ)
- කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත / නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

## තෝරා ගැනීමේ පටිපාටිය

තරග විභාගයකින් අනතුරුව ලැයිස්තුගත කරනු ලබන (short listed) අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("Careers" තීරය) හරහා 2021 ජනවාරි මස 09 දින හෝ ඊට පෙර ඔබේ ජීවදත්ත එවිය යුතු අතර එම "අයදුම්පතෙහි යොමු අංකය" ඔබේ අනාගත පරිශීලනය සඳහා සුරැකිව තබා ගන්න.

*ඉහත ඉල්ලුම් කිරීමේ පටිපාටියට අමතරව වෙනත් කිසිදු මාර්ගයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.*

*ඉහත සඳහන් අපේක්ෂිත සුදුසුකම් රහිත හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය, කොළඹ 01.**

*කිසියම් අයුරකින් හෝ බලපෑම් සිදු කිරීම වහාම නුසුදුසු බවට පත් කිරීමට හේතු වනු ඇත.*
*තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.*